9 ශ්‍රේණිවල සිසු දරු දැරියන් සඳහා

II වාරය - i කාණ්ඩය - 51 පිටුව.

පෙළ පොතේ ⑦ වැනි පාඩම

දූසේ නිල් ඇහැය.

* "දූසේ නිල් ඇහැය" නම් වූ නිසඳැස් පද්‍ය හොඳින් කියවන්න එහි අර්ථය ඇතුළු විශේෂ ඔබට අවබෝධ කරගත හැකි වේවි. මෙම කාව්‍ය පෙළෙන් කියවෙන්නේ කවිඳියකගේ සිතුවිලි සමුදායකි. ඇය තම ස්වාමි පුරුෂයා පිළිබඳ අතීතය භක්තියකින්, ඔහු දරු පවුල රැකීමට ගත්තා වෙහෙස පිළිබඳව සිහිපත් කරයි.

"ඔබ වෙනුවෙන් වැදෙන ලතෝ
සිනා හඬම කන් දී ගෙන"

මෙහි 'ඔබ' යනු ස්වාමි පුරුෂයාය. සිනා හඬ ලෙසින් දක්වා ඇත්තේ ඔහුගේ සිනු නගමින් ඔහු උදුරන හඬයි. ඇය (මව) තරුණ අවධියේදී ඉතා රූමත් වුවත් විවාහ දිවියේදී ඉහළ ගත්තට සිදුවී ඇති නොයෙක් දුක් කම්කටොලු නිසා ඇගේ 'දූසේ නිල් ඇහැය' පෙවී ගොස් ඇති බව කවියා පවසයි.

'ඔබ පොළවත විට ළිප තිබී' - දූසේ නිල් ඇහැය පෙවී ගිය බව කවියා දක්වා ඇත.

සැමියා ධීවරයෙකි. ඔහු මුහුදු ගිය විට ඇය දරුවා සමග තනි වෙයි. 'හිරු අවරට ගිය බව' ලෙසින් කවියා දක්වන්නේ හිරු බැස ගිය බවයි. සංකේතයෙන් දක්වන්නේ ඇගේ ජීවිතයට අඳුර උදාවූ බවයි.

"ඔබ එනතුරු මග බලමින්
දිවි ගමනක් ගෙවනා විට" — ඇගේ දූසේ නිල් ඇහැය අඳුරට දිය විය.

"බත් දෙකටක් උපයන්නට
අඩු කොටු පුරවා දවසෙම"

සැමියා අධික ලෙස වෙහෙසෙන බව ඉහත කවි දෙපදයෙන් දක්වා ඇත. ඔහු අධික වෙහෙස නිසා නිදි පැදුරේ වැතිරී කෙඳිරිලි හඬ නගයි. එහි දුකට ඇය හද පිරිසා හළ කඳුලට - දුසේ නිල් අහස සේදී ගලා ගිය බව දක්වයි.

බිරිඳ තරුණ වියේදී ඇගේ නෙත් නිල් ඉදුවර මලක නිල් පැහැයෙන්, ඈත දියඹ නිල් පාට ජලයේ නිලයෙන් ඇගේ සැමියා උපමා (උපමා) කළ බව ඇයට සිහිවේ. ඇය ඒ ගැන කම්පා නොවේ. අතීතය ගැන සිතමින් ඇගේ රූපශ්‍රීය නැතිවූ බව සිතමින් දුක් නොවන ලෙස ඇය සැමියාට පවසයි. ඇය කටුක දිවිය නැමති මඩ ගොහොරුවේ නිල් මහනෙල් මලක් දකින්නීය. ඒ ඔවුන්ගේ දියණියයි. ඒ බලාපොරොත්තුව ඇය සැමියාටද බලාපොරොත්තු ඇති කරවයි. ඒ නිසා ඇය (බිරිඳ) ගැන නොසිතා දුවගේ අනාගතය දෙස බලන ලෙස සැමියාට පවසයි.

* දැන් මෙම කවි පෙළ පිළිබඳ ඔබට අවබෝධයක් ලැබෙන්නට ඇතැයි සිතමි. ඒ ඇසුරින් පෙළ පොතේ 61 වැනි පිටුවේ ඇති අභ්‍යාසයට පිළිතුරු ලියන්න.

* ව්‍යංගාර්ථ යනු - කෙළින්ම නොකියා හඟවා කියන අදහස්.

උදා: ලෙස - දුසේ නිල් අහස දියවූ බව.
(එනම් මව වයසට ගිය බව)
දවසෙම බත් දෙකටක් උපයන්නට - අඩු කොටු පුරවා
(සැමියා/පියා අධික ලෙස වෙහෙසෙන බව)